www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පිට්ස්බර්ග්හි පැවැත්වෙන ජී 20 සමුලුවට ඉහලින් ලඹදෙන මහා බලවතුන්ගේ ගැටුම්

## Great power conflicts overhang G20 summit in Pittsburgh

**බැරී ග්‍රේ විසිනි**

**2009 සැප්තැම්බර් 24**

24,25 යන දෙදින තුල පිට්ස්බර්ග්හි, ප්‍රධාන ආර්ථිකයන් 20 කන්ඩායමේ දේශපාලන නායකයන්ගේ හා මධ්‍යම බැංකුකරුවන්ගේ සමුලුව පැවැත්වෙන අතර වාරයේ ඔවුන් මුහුන දෙන්නේ, ලෝක ආර්ථිකය පනගැන්වීමේ හා තවත් මූල්‍ය ව්‍යසනයක් වලක්වා ගැනීමේ ප්‍රතිපත්ති මත, වඩ වඩාත් එලිමහනට පැමිනෙන වධකාරී ගැටුම් වලට පැලැස්තර දමාගැනීමේ කර්තව්‍යයටයි.

ගෝලීය මූල්‍ය පද්ධතිය බිඳවැටීමේ අද්දරටම පැමිනීමෙන් වසරකට පසුව, පසුගිය වසරේ නොවැම්බරයේ වොෂින්ටන්හි දීත්, මේ වසරේ අප්‍රේල් මාසයේ ලංඩන්හි දීත් පැවති ජී 20 සමුලු දෙකෙහි දී ම ප්‍රකාශයට පත්කල, බහුපාර්ශවීය සම්බන්ධීකරනය හා ආරක්ෂනවාදී ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කිරීම, ආර්ථික ප්‍රතිපත්ති මත ඇතිව තිබෙන බෙදීම් මගින් වසාගෙන තිබේ. මෙම වෙනස්කම්, එක්සත් ජනපදයේ, යුරෝපයේ, හා ආසියාවේත්, ලතින් ඇමරිකාවේත් නැගී එන ආර්ථික බලවතුන්ගේ, සියල්ලටත් වඩා චීනයේ, පාලක පැලැන්තීන්ගේ ජාතික ආසක්තයන්ට අනුකූල වෙයි.

ඔබාමා පාලනාධිකාරය විසින් ඉදිරිපත් කොට ඇති "වර්ධනයේ තිරසාර හා සමබර ආකෘතිය" කෙරෙහි ප්‍රතිචාර දක්වමින්, 22 දා ජර්මානු නිලධාරියෙක් අනතුරු ඇඟවූයේ, "මතභේද පුලුල් කිරීමක්" ගැන සඳහන් කරමිනි.

සමුලුවට යන්තම් දෙසතියකට පෙර, ඔබාමා පරිපාලනය විසින් එක්සත් ජනපදයට කෙරෙන චීන ටයර් අපනයන මත සියයට 35 ක බද්දක් නිවේදනය කිරීමත් සමඟ, එක්සත් ජනපදයෙන් කෙරෙන වාහන අමතර කොටස් හා කුකුල් මස් අපනයන වලට එරෙහිව පියවර ගන්නා බවට චීනයෙන් එල්ල වූ තර්ජනවලින්, ලෝකයේ විශාලතම ආර්ථිකය හා තෙවන විශාලතම ආර්ථිකයන් අතර වෙලඳ යුද්ධයේ අවතාරය හිස එසවීය.

සාරය වශයෙන් ගත් කල, එක්සත් ජනපදය විසින් යෝජනා කල "ආකෘතිය" වනාහි, ඇමරිකානු බැංකු පද්ධතියේ බිඳ වැටීම මගින් ගිනිගත් අර්බුදයේ බර, වොෂින්ටනයේ ප්‍රමුඛ ගෝලීය තරඟකරුවන් මත පැටවීමට දරන ලද උත්සාහයකි. "ගෝලීය අසමතුලිතයන්" ජයගැනීමේ හා සහයෝගීතාවයේ පරහිතකාමී භාෂාවෙන් මෙම ජාතිකවාදී නැඹුරුව සරසා තිබුනි.

කෙසේ වෙතත්, එක්සත් ජනපදය ක්‍රියාත්මක වන්නේ, මීට පෙර අර්බුදයන්ට වඩා සැලකිය යුතු තරම් දුබලවූ තත්ත්වයක සිටයි. 23 දින වෝල් ස්ට්‍රීට් ජර්නලය පෙන්වා දුන්නේ, "දශකයකට පෙර හටගත් ආසියානු මූල්‍ය අර්බුදයේ පටන් ගෝලීය බලයේ මාරුවක්" සිදුව ඇති බවයි. "එවකදී ගෝලීය මූලෝපාය බොහෝ කොටම සකසනු ලැබූ එක්සත් ජනපද භාන්ඩාගාරය, සිය සැලසුම් සඳහා මූල්‍ය සම්පාදනයටත් උදව්වටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) කැඳවා ගත්තේය.

"මෙවර, එක්සත් ජනපද මූල්‍ය පද්ධතිය ගැටලුවේ හදවතෙහිම පවතින තත්ත්වය තුල, සංවර්ධනය වන විශාල ජාතීන් ආර්ථික වශයෙන් පෙර නොවූ තරමේ විශාල භූමිකාවක යෙදී සිටිය දී, (භාන්ඩාගාර ලේකම් තිමෝති) ගීත්නර්ට ඉතා සීරුවෙන් පියවර තැබීමට සිදුව ඇත. එහි එක් කොටසකට, එක්සත් ජනපදයේ සාපරාධීත්වය පිලිගැනීම ද ඇතුලත් ය. 'ඔහු වැයම් කරන්නේ බලයෙන් නම්මාගැනීමට වඩා සාමයෙන් කටයුතු කිරීමට' යයි බෲකින්ග්ස් ආයතනයේ අර්ථ ශාස්ත්‍රඥ එස්වාර් ප්‍රසාද් කියා සිටියේ ය."

මෙම "සීරුවෙන්" අඩිය තැබීමේ ප්‍රවිෂ්ටයෙහි එක් කොටසක් වන්නේ, චීනය, ඉන්දියාව, බ්‍රසීලය හා අනෙකුත් නැගී එන ආර්ථිකයන් එක්සත් ජනපද "ආකෘතියේ" ප්‍රධාන අඩයක් ලෙස කටයුතු කිරීම සඳහා පොලඹවා ගැනීමයි. මේ සඳහා ජාමූඅ තුල එම රටවල ඡන්ද බලය වැඩි කිරීමට උදව් කරන අතර එය, ජාමූඅ තුල යුරෝපීය බලවතුන්ගේ හඬ දුබල කරන අතර, ඔවුන් එය නුරුස්සයි.

පිට්ස්බර්ග් සමුලුව තුල එක්සත් ජනපදයෙහි තත්ත්වයේ හැකිලීම, ඇසෝසියේටඩ් ප්‍රෙස් හි කැටි කොට දක්වා තිබුනේ මෙසේය: "ඩොලර් ට්‍රිලියන ගනන් හිඟයන් ද, දුබල වන ඩොලරය ද හමුවේ එක්සත්

ජනපදයට, කාලයකට පෙර ආර්ථික සමුලු තුල පැවති බලපෑමේ හැකියාව දැන් ඇත්තේ නැත. දැන් ජර්මනිය, ප්‍රන්සය මෙන්ම චීනය හා බ්‍රසීලය වැනි මේසය වටා සිටින අලුත් ගැටයන් සියලු දෙනා විසින් තම තමන්ගේ ම ප්‍රශ්න ඉදිරියට තල්ලු කරමින් සිටියි."

සමුලු පරිශ්‍රයට මත් සංකේතාත්මක වැදගත් කමක් හිමිව තිබේ. එක් අවධියක දී වානේ කර්මාන්තය අතින් ගෝලීය මධ්‍යස්ථානය බවට පත්ව තිබුනු තැනෙහි වානේ කර්මාන්තය දැන් අභාවයට පත්ව තිබීම, එක්සත් ජනපද කර්මාන්තයේ දිරාපත්වීම හා එක්සත් ජනපද ධනවාදයේ පරිහානිය කැටිකොට දක්වන රූපයෙහි පිලිබිඹුව වී තිබේ.

එහි ඉහල නගින අයවැය, වෙලඳ හා ජංගම ගිනුමේ හිඟයන් නිසාම එක්සත් ජනපදය, තවමත් දැවැන්ත බලයක් අතැතිව සිටින බව කියනු ලැබේ. ඩොලර් බිලියන සිය ගනනින් එක්සත් ජනපද භාන්ඩාගාර බැඳුම්කර ලඟ තබාගෙන සිටින චීනය හා ජපානය වැනි රටවල්, ඩොලරයේ බිඳවැටීමක් තමන්ගේ ම ආර්ථිකයන්ට විනාශය ගෙනෙන තත්ත්වයක් ලෙස දකින අතර, අපනයන මත බෙහෙවින් රඳ පවතින, යලිත්, චීනයට හා ජපානයට මෙන්ම, ජර්මනියට ද පන ගැන්වෙන හා වර්ධනය වන එක්සත් ජනපද වෙලඳපොල වෙත පිවිසීම සම්බන්ධයෙන් ඇත්තේ ඉමහත් වැදගත් කමකි.

ඔබාමා පාලනාධිකාරයේ "ආකෘතිය" මඟින් එම බලය, ඇමරිකානු මූල්‍ය හා ව්‍යාපාරික ප්‍රභූ පැලැන්තියේ ආසක්තයන්ට අනුකූල වන පරිදි හැසිරවීමට උත්සුකව සිටියි. එක්සත් ජනපද යෝජනාව තුල මූලික උපාංග තුනක් තිබේ.

පලමු වැන්න, එක්සත් ජනපදය මූලිකත්වය දරන නය ගැති ජාතීන් ද චීනය, ජපානය හා ජර්මනිය වැනි වෙලඳ හා ජංගම ගිනුම් අතිරික්තයන් සහිත ජාතීන් ද අතර ඇතිව තිබෙන ගෝලීය ආර්ථික අසමතුලිතයන්ට විසඳුම් සැපයීම සඳහා, කැපවීමක් ජී 20 ජාතීන් වෙතින් ලබාගැනීමට එක්සත් ජනපදය දක්වන උත්සුකයයි. එලඹෙන දශකයේ ඩොලර් ට්‍රිලියන 9 ක් වේ යයි ඔබාමා පාලය විසින් ගනන් බලා තිබෙන අයවැය හිගය, පියවීමට අදාල ප්‍රතිපත්ති එක්සත් ජනපදය විසින් ප්‍රකාශයට පත්කරනු ඇත. අතිරික්තයක් සහිත ජාතීන්, අපනයන මත සිය රඳ පැවැත්ම අඩුකිරීමට එකඟ විය යුතුය. චීනය සම්බන්ධයෙන් මෙය දේශීය ඉල්ලුම ඉහල නැංවීමෙන් ද, යුරෝපය සම්බන්ධයෙන් මෙය ව්‍යාපාරික ආයෝජන ඉහල දැමීමට අදාල ඊනියා "ව්‍යුහාත්මක වෙනස්කම්" ඇති කිරීමෙන් ද සිදු විය යුතුය.

අවශ්‍ය වෙනස්කම් ඇතිකිරීමට අසමත් වන රටවලට විරුද්ධව සම්බාධක නොපැන වුවත්, අනුකූලව කටයුතු නොකරන රටවල් මත පීඩනය යෙදවීමේ "සීරුවෙන් කරන විමර්ෂන" ක්‍රියාවලියක් ජාමූඅ විසින් නිරීක්ෂනය කරනු ඇත.

චීනය, ඊටත් වඩා ප්‍රබල ලෙස ජර්මනිය, මෙම යෝජනාව විවේචනය කර තිබේ. ඔවුන් එය දකින්නේ, සිය වෙලඳ අතිරික්ත ප්‍රතිපත්ති වලට පහරදෙන යාන්ත්‍රනයක් ලෙසය. එක්සත් ජනපදය දිගටම ජාමූඅ ආධිපත්‍යය දරන තත්ත්වය මත, ඔවුන් වඩාත් දෙගිඩියා සහගතව ඇත.

එක්සත් ජනපද පාලක පැලැන්තිය සම්බන්ධයෙන් ගත්කල, ලෝක ආර්ථිකය පිලිබඳ එවන් "ප්‍රතිතුලනයක්," ඇමරිකානු කම්කරු පන්තියේ ජීවන තත්ත්වයන් මත එල්ල කරන ප්‍රහාරයක් සමඟ බැඳී තිබේ. සීඑන්එන් සමඟ 20 වන දින පැවති සම්මුඛ සාකච්ඡාවක දී ඔබාමා, ජී 20 වෙත ඉදිරිපත් කොට ඇති එක්සත් ජනපද යෝජනාව, දේශීය පරිභෝජනය කැපීමේ තම පරිපාලනයේ ප්‍රතිපත්තිය සමඟ අනන්‍ය කලේය.

"චීන හෝ ජර්මන් හෝ වෙනත් රටවල් සියල්ලම අපට විකුනන අතර, අප ක්‍රෙඩිට් කාඩ් නය හෝ නිවාස දේපල නය රොත්තක් ගන්නා නමුත්, ඔවුන්ට කිසිවක් නොවිකුනන යුගයක් කරා අපට ආපසු යා නොහැකිය." ඔහු එසේ පැවසීය. ඔබාමා නොකී දේ නම්, එක්සත් ජනපද පරිභෝජනයේ මෙම කැපීම වැඩ කරන ජන සමූහයන්ට මිස මූල්‍ය ප්‍රභූවට නොයෙදෙන බවයි. එසේම එය අත්පත්කර ගන්නේ, වැටුප් පහත හෙලීමේ අවියක් ලෙස ඉහල විරැකියා මට්ටමක් පවත්වා ගැනීමත්, ඒ සමඟ පෙර නොවූ විරූ පරිදි සෞඛ්‍ය පහසුකම් වැනි සමාජ සේවා මෙන්ම මෙඩි කෙයාර්ස්, මෙඩි කෙයාර්ඩ් හා සමාජ ආරක්ෂක වැනි හිමිකම් කපාදැමීම එකට බද්ධ කරන බවත්ය.

යුරෝපීය ආර්ථිකයන් තුල "ව්‍යුහාත්මක වෙනස්කම්" සඳහා කෙරෙන ඉල්ලීම වනාහි, කම්කරුවන් සඳහා වන සමාජ ආරක්ෂනයේ ඉතිරිව ඇති සියල්ල බිඳ විසුරුවා හැරීමත්, එක්සත් ජනපද භාන්ඩ හා සේවා වෙනුවෙන් මෙම ආර්ථිකයන් තවදුරටත් විවෘත කිරීමේ වෙනත් පියවර සඳහාත්, යොදන අන්වර්ථ නාමයයි. කම්කරු පන්තියේ ජීවන තත්ත්වයන් මත තමන්ම පහර එල්ල කිරීමේ යෙදී සිටින යුරෝපීය ධනේශ්වරය, දොට්ටදැමීම් වලට එරෙහිව තවමත් ඉතිරිව පවත්නා නීතිමය බාධක අහෝසි කිරීමේ විවෘත හා විනාශකාරී පියවර ද, "ඇමරිකානු වර්ගයේ" ශ්‍රම ප්‍රමිතීන් ඇටවීම සඳහා ද, දරන උත්සාහයක දේශපාලන ඇඟවීම් පිලිබඳව දෙගිඩියාවෙන් පසු වෙති.

එක්සත් ජනපද "ආකෘතියේ" දෙවන තට්ටුව වන්නේ, බැංකු විසින් තබාගත යුතු ප්‍රාග්ධන සංචිත

මත වඩාත් නිර්ධය සීමා පැනවීම සඳහා කෙරෙන ඉල්ලීමයි. 2010 අග වන විට, එවන් ප්‍රමිතීන් පිලිබඳ එකඟතාවක් ද 2012 අග වන විට ඒවා ක්‍රියාවට නැඟීමක් වෙනුවෙන් ද, ගීත්නර් පෙනී සිටියි.

යුරෝපීයන් මෙය දකින්නේ, එක්සත් ජනපද බැංකු සමඟ ගත්විට තමන්ගේ බැංකු ක්ෂේත්‍රයන්, අවාසිදායක තැනකට පත්කරන උත්සාහයක් ලෙසය. එක්සත් ජනපදයේදී වෝල් වීදියට ඇප දීමේ විශාල පරිමාන නය හේතුකොටගෙන එහි මහා බැංකු, සිය යුරෝපීය තරගකරුවන්ට වඩා දැනටමත් දැවැන්ත ප්‍රාග්ධන සංචිත සතුකරගෙන සිටින බැවින්, එම බැංකු වලට පහසුවෙන්ම ඉහතකී අවශ්‍යතාවන් සපුරාලිය හැකිය.

පසුගිය සතියේ පැවති සම්මුඛ සාකච්ඡාවක දී එක්සත් ජනපද යෝජනා ගැන අදහස් දක්වමින් ප්‍රන්ස මුදල් ඇමති ක්‍රිස්ටීන් ලැගාඩ් මෙසේ පැවසුවාය. "ලෝකයේ ඇති සියලුම බැංකු, ඒවා අර්බුදයට පෙර පැවතියාට වඩා ප්‍රාග්ධනකරනය කිරීම අවශ්‍යය." එහෙත් පනවන විශේෂ නීති සමුදායක ප්‍රතිපලය ලෙස, "මහජන අරමුදල් සම්පාදනය කර, අනෙකුන්ගේ වියදමෙන් දැවැන්ත ප්‍රතිව්‍යුහකරනයකට ලක් කර තිබෙන එක් කන්ඩායමකට (බැංකු) වාසිය සැලසෙන්නේ නම් එය අවසානයේදී විකාරයක් වනු ඇත."

එක්සත් ජනපද "ආකෘතියේ" තුන්වන උපාංගය වන්නේ, නැගීඑන විශාල ආර්ථික බලවතුන්ට ජාමූඅ තීන්දු ගැනීමේදී වැඩි බලතල පැවරීමයි.

බ්‍රිතාන්‍ය ආර්ථිකය ගෝලීය මූල්‍ය මධ්‍යස්ථානය ලෙස මුල්බැස ඇති තම බැංකු ක්ෂේත්‍රයේ ක්‍රියාකලාපය මත මුලුමනින්ම පාහේ රැඳී සිටින අතර එය, පොදුවේ එක්සත් ජනපද යෝජනා පිටුපස පෙලගැසී සිටියි. සිය අපනයන ප්‍රතිපත්ති වෙනස් කිරීමට හා තම ජංගම ගිනුමේ අතිරික්තය අඩුකර ගැනීමට අසමත්වන රටවලට එරෙහිව දඬුවම් පැමිනවීමේ මාධ්‍යයන් ලෙස, තම යුරෝපීය පිලිමලුන්ට එරෙහිව සම්බාධක පැනවීම, බ්‍රිතාන්‍යයට අවශ්‍යව තිබේ.

එක්සත් ජනපදයට පක්ෂපාතී න්‍යාය පත්‍රයක් සඳහා කඩතුරාවක් ලෙස, ගෝලීය ආර්ථික අසමතුලිතයන් මත එක්සත් ජනපදය යොදන අවධාරනය විවේචනයට ලක්කර තිබෙන ප්‍රන්සය හා ජර්මනිය, ඒ වෙනුවට, බැංකු පිලිබඳව දැඩි ගෝලීය නියාමනයක් ඉල්ලා සිටියි. එමගින් ඔවුන්, තමන්ගේ ම බැංකු ක්ෂේත්‍රයන් පුම්බා ගැනීම සඳහා වෝල් වීදියේ කීර්තිය හා බලපෑම පිරිහීමේ වාසිය ඩැහැ ගැනීමට බලාපොරොත්තු වෙයි.

බැංකුකරුවන්ගේ දීමනා පාලනය කිරීම පිලිබඳ සටන්පාඨය යටතේ ඔවුන් සිය එක්සත් ජනපද විරෝධී න්‍යාය පත්‍රය ඒත්තු ගැන්වීමට උත්සාහ කරයි. මේ ගැන විශේෂිත වන ප්‍රන්ස ජනාධිපති නිකොලායි සාකෝසි, බැංකුකරුවන්ගේ වැටුප් මත සඵල සීමාවන් පැනවීමේ ඉල්ලීම ඉදිරිපත් කලේය. කෙසේ වෙතත්, සමුලුව සමීප වෙමින් තිබිය දී ඔහු හා ජර්මන් චාන්සලර් ඇන්ජිලා මර්කෙල්, ඇමරිකානුවන්ට බරපතල සීමාවන් නොපැනවෙන හා එම නිසා ඔවුන්ට පිලිගත හැකි වන, පැලැස්තර ගැසූ යෝජනාවක් සම්මත කර ගැනීමේ අපේක්ෂාවෙන්, එවන් ඉල්ලීම් හකුලාගෙන තිබේ.

සමුලුව පිලිබඳව අදහස් පලකල බෘකිංස් ආයතනයේ අර්ථශාස්ත්‍රඥ ප්‍රසාද් පැවසුවේ, "සාර්වආර්ථික ප්‍රශ්න සම්බන්ධයෙන් තවමත් විභේදනයක් පවතින" බවයි. "යෝජිත ආකෘතිය, සිය දැවැන්ත අයවැය හිඟය වෙතින් අවධානය ඉවතට හැරවීම සඳහා එක්සත් ජනපදය විසින් යොදන යටකුට්ටු උප්පරවැට්ටියක් ලෙස චීනය තවමත් සලකයි." ඔහු එසේ පැවසීය.

හිටපු ජාමූඅ ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ සයිමන් ජොන්සන්ගෙන් උපුටාගෙන *වෝල් ස්ට්‍රීට් ජර්නලය* සඳහන් කලේ, අතීතයේ යොදාගෙන අසාර්ථකවී තිබෙන "හිස් පුරසාරමක්" ලෙස ඔහු, එක්සත් ජනපද යෝජනා හැඳින්වූ බවයි.

මෙම මතභේදකාරී ආසක්තයන් හි ප්‍රතිපලය විය හැක්කේ, 1930 ගනන් වලින් පසුව ඇතිවූ ලොකුම ආර්ථික අර්බුදයට තුඩුදුන් පද්ධතිමය ගැටලු වලට කිසිදු විසඳුමක් ඉදිරිපත් කිරීමට අසමත් හා, ආර්ථික ජාතිකවාදය තව දුරටත් ඉස්මතු කරන්නාවූ ද ජාත්‍යන්තර ආතතීන් ගැඹුරු කරන්නාවූ ද වාතාවරනය සඳහා වේදිකාව සකසන බලරහිත ජී 20 යෝජනාවකි.

ආර්ථික අර්බුදයට, ජාත්‍යන්තරව සම්බන්ධීකරනය කල තර්කාන්විත ප්‍රතිචාරයක් දැනවිය හැකි කිසිදු පදනමක් ධනවාදයේ රාමුව තුල ඇත්තේ නැත, ලෝක ආර්ථිකයේ වර්ධනයට ප්‍රතිවිරුද්ධව පිහිටා සිටින ජාතික රාජ්‍ය පද්ධතියක් ලෙස පැලපදියම්ව ඇති ධනේශ්වර පද්ධතියේම බිඳ වැටීම, වත්මන් අර්බුදය මඟින් සලකුනු කරයි. අර්බුදය, වෙලඳපොලවල හා ලාභ ශ්‍රමයේ පාලනය සියතට ගැනීමට මහා බලවතුන් අතර නව පොරයක් අවුලුවා ඇති අතර, එම ගැටුම, සමාජවාදය සඳහා අරගලය තුල ජාත්‍යන්තර කම්කරු පන්තිය බලමුලු ගැන්වීම තුලින් නොවිසඳනු ලැබුව හොත් තුඩුදෙනු ඇත්තේ, දූගීභාවය ඉහල නැගීමටත් යුද්ධයටත් ය.

© www.wsws.org